# ලෝ වැඩ සඟරාව

## නමෝ බුද්ධාය

1. සෙත් සිරි දෙන මහ ගුණ මුහු දාණන්
ස ත් හට වන බව දුකට වෙ දාණන්
ති ත් ගණඳුරු දුරලන දිනි ඳාණන්
සි ත් සතොසින් නමදිම් මුනි ඳාණන්

2. ඇ ම පම ණින් පැවසූ මුනි දැන තතු
මෙම හැම දෙන බලවයි දැක්විය යුතු
ත ම තම නැණ පමණින් දැනගත යුතු
ම ම නම දිම් සදහම් පහදා සිතු

3. සිරිමත් බඹ සිරසෙහි පා පිසිනා
සැරියුත් මහමුගලන් පිළිවෙළිනා
පිළිවෙත් සරු මහ සඟගණ සොබනා
මුදුනත්බැඳ නමදිම් බැති පෙමිනා

4. ම න ර ම් න ර ද ම් සැරිදම් සඟනට
මෙලෙසින් බැතියෙන් අදරින් නමකොට
වෙසෙසින් පෙළදම් නොමදත් දනහට
ප ව ස ම් කළකම් පලදැන් හෙළු කොට

5. ද හ ම ට සරිකොට එළුවෙන් පෙර කී
ක වි ය ට සිත පහදා සිට නිසැකී
සිහි කොට කඳ පිළිවෙළ දොස් නොයෙකී
නිව න ට සපැමිණි සඟ සැට නමෙකී

6. එබැවින් එළුවෙන් කීවයි අනදර
නොවමින් බැතියෙන් අදරින් නමකර
සතොසින් ඇසුවොත් මෙදහම් මනහර
සැබැවින් සිදුවෙයි සගමොක් සිරිසර

7. බි ම ඉඳ සිට කී බණ නාසන්නේ
වි ම තිව උඩ ඉඳ සිට නාසන්නේ
කැම තිව කීවොත් විමසා සන්නේ
එ ම වද සගමොක් සැප සාදන්නේ

8. සි ය ල් සසරදුක් දුරැකර නොයෙකී
අ ස ල් කරන මොක් සිරි සැප නිසැකී
සි ය ල් සතුනි පින් කරවයි මුනි කී
නොකල් අටෙකි පින්කම් කළ නොහැකී

9. සි තු ව ත් බිය කරවන අරතරයේ
වැටවු නාත් එක්සිය සතිසක් නිරයේ
බ ල ව ත් දුක් විඳිනෙය කරදරයේ
ම ඳ කු ත් පිණකට නැත අවසරයේ

10. තිරිසන් ජාතියෙ උපනත් පව් කොට
අවසන් නොව බිය පවතී පිට පිට
මඳසන් සුන් කමකුත් නැත හැම විට
සලසන් නේ කෙලෙස ද සිතු පිණකට

11. උපනත් පේතව පව් කොට නොපණත්
කලෙකත් නොලැබෙයි සෙම් සොටු පමණත්
උගු ර ත් නොතෙමෙයි සුරගඟ වැටුනත්
කලෙකත් පින් නොකළැකිමැයි සිතුනත්

12. පව් මිස පිණකැයි නොකරන හැම කල
මුණි බණ නොපවතිනා පිට සක්වල
නිසි ලෙස උපනත් ලැබ දන මනකල
කිසිකලෙකත් කුසලක් නොකළැකි බල

13. දද මිනිසුන් බස් ගෙන කිසි කලෙකය
තද අකුසල් කොට කුසලින් වැළකය
අඳ ගොලු බිහිරිව ලදුවත් මේකය
මඳ පිණකුත් නොපිරෙයි බල නිසැකය

14. සිත මිස කය නැති බඹලොව සතරෙකි
සිත නැතිවම කය ඇති බඹ තලයෙකි
මෙද සත පින් කොට උපදින පෙදෙසෙකි
එහි උපනත් කුසලක් නොම කළ හැකි

15. බල කොටු වන් තර මෙසසර නුවරේ
මු ල සැටු වන් දලු ලන පව් පඳුරේ
වි ස ක ටු වන් සගමොක් මග අතුරේ
මි ස දි ටු වන් අයටත් පින් නොපිරේ

16. බුදු කෙනෙකුත් මේ ලොව නූපන් වර
අඳු රෙක්මය සදහම් නැති මෙසසර
ඉඳු රා නොදැනෙයි පව්පින් තොරතුර
සිදු නොකළැකි ඉන් සගමොක් සිරිසර

17. සැබවින් බණ ඇසුවත් මුනිඳුන් කී
ගොළුවන් බිහිරන් සේ නොව සැළ කී
ඉඳිං න න් මිස තොප කුසලින් වැළ කී
මෙලෙසින් පින් නොකළැකි කල් අටෙකී

18. දිගු පුළුලින් සක්වළ වන් සිඳු කුස
සියවසකින් උඩ එන කැස්බා හිස
වියසිදු රෙන් නැගෙතත් දුගතිය බැස
තව උපදින් නට බැරි මෙ මිනිස් කුස

19. ක ල කිනි බුදු කෙනෙකුන් උප දින්නේ
දුකකි නි මිනිසත් බව ලැබ ගන්නේ
මෙදෙකිනි මෙසසර දුක් දුර ලන්නේ
සඳු නෙනි කිම වීරිය නොකරන්නේ

20. ප ස් පව් කොට මෙතනත් ලැබ සෝකය
ගොස් නිරයේ දුක් විඳිති අනේ කය
රැ ස් කොට ඉන් පින් මෙමිනිස් ලෝකය
ස් ස් නොකරව් කලකින් ලත් මේ කය

21. කන් නන් මෙන් විස අඹ පල රිස්සේ
මන් සන් තොස් කර කිම පල සෙස්සේ
දැන් දැ න් එයි මරුවා පසු පස්සේ
ඉන් පින් මය කටයුතු නම් දස්සේ

22. ඉ ස ගිනි ගත්තකු එගිනි නිවන ලෙස
කු ස ලට මඳකුත් පමා නොවනු මිස
මෙස සර අත්හැර නොයන මෙදුක් රැස
වෙස සින් නැත අත්හරිනා උපදෙස

23. තැත කින් ගෙන දැමුවත් කැට නුබකුස
අ ත රක නොරඳන මෙන් මේ බිම මිස
සි ත සතොසින් පින් නොකළොත් නිසි ලෙස
නැත සිටිනා තැන් සතර අපා මිස

24. තිරව නොසිත කුණු කය මෙත මායේ
නොතිර බවට විදුලිය උප මායේ
නිතර මෙකය පවකට නොන මායේ
කරව කුසල් වීරිය නොප මායේ

25. අඳුරෙහි අස්ලොම විඳිනට දුර දී
විදුලිය පැහැ වැරදුන හොත් වර දී
විදුලිය වන් මේ කය ලත් තැන දී
සිදු නොකළොත් මතු සගමොක් වර දී

26. කොතන වුනත් නැත මරුහට බාදා
වි ඳි න මෙසැප පින් ඇති තෙක් වේදා
ගෙවන සසර දුක් බුදු බණ නාදා
කු ම න නැටුම් කෙළි කවට සිනාදා

27. සැදැහැත් තන්හට බව දුක් නොකැමති
ය හ පත් කල් මේ කල් මිස වෙන නැති
දනිතොත් දන්සිල් ගුණ සත නොනැවති
පැයකුත් අවුරුදු දහසක් විතරැති

28. අද අ ද එයි මරු පින් කර ගන්නේ
කෙලෙසද සෙට මරු නේති සිතන්නේ
කි ක ල ද මහසෙන් මරු ඇප වන්නේ
කු ම ටද කුසලට කම්මැලි වන්නේ

29. කුම ට ද කා බී නිති සැරසෙන්නේ
කොතනද මේ කය ඇරගෙන යන්නේ
ඇම ස ඳ නොමැළිව පින් කර ගන්නේ
එ ම ව ද බව සයුරෙන් ගොඩ ලන්නේ

30. තෙරව සසර සයුරෙන් තොප නොලසා
ති ර ව ලබන මොක් සිරි සැප උදෙසා
තොරව පවින් නිතරම මුනි බණසා
ක ර ව කුසල් වීරිය පසු නොබැසා

31. හැම විට පිණටම සිත පාදන්නේ
නිවනට මග එමවද සාදන්නේ
වැඩකට කී බස් කිම නාදන්නේ
නිර ය ට වන් කලදෝ තොප දන්නේ

32. මොක් සිරි දෙන මුනිඳුන්ගේ උපතකි
කප්කෙළ සිය දහසකිනුත් නොලදැකි
පත්වූ එ බුදුන්ගෙන් යුත් මෙකලකි
එත් වැරදුන නැත පරලොව පිහිටෙකි

33. අ ත් වැඩ පර වැඩ සමව සිතන්නේ
මෙත් සිත සව්සත කෙරෙහි කරන්නේ
එ ත් බැරි නම් තොප සසර ගෙවන්නේ
සෙත් පුර සැප කෙලෙසක ද ලබන්නේ

34. ම ස් ලේ නැති ඇට බලු ලෙවකන්නේ
කු ස් පිරුමක් පලයක් නොලබන්නේ
ලෙස් ඒ සැපතෙහි ලොබ නොසිතන්නේ
දොස් නොපෙනෙනු මිස දුක්මයි වන්නේ

35. මස් කැටියක් ගත් උකුසෙකු අහසේ
මස් නොදැමුව උකුසන්ගෙන් වැනසේ
පස් කම් රස ලොබ කළහොත් එමසේ
පස් විසි මහ බයකින් දුක් සැලසේ

36. සෙත සලසන මුනි බණ ඇත සුම්හිරි
ඇ ත තොපගේ කන් ඇසුමට නොබිහිරි
නැත කරනට පිණකුත් මෙ තොපට බැරි
සතර අපා දුක් වඳ විඳිනට බැරි

37. කරන කලට පව් මීරිය මී සේ
විඳින කලට දුක් දැඩි වෙයි ගිනි සේ
ඇඳින එපව් දුරලන උපදේ සේ
නුදුන මැනවි තුන්දොර අවකාසේ

38. අ ද මි න් ජීවත් වෙනවා විතරට
දැහැමින් මියයනු සොඳමැයි දනහට
මෙලෙසින් වදහළ මුනි බණ සිහි කොට
සැබැවින් පින් කොට පැමිණෙව් නිවනට

39. එ ක ම සතකු තම මව් මළ දුකටා
වෙනම හැඬූ කඳුලේ බිඳුවල ටා
මෙහැම මුහුදු දිය අඩුවන කල ටා
ත ව ම සසර ආලය ඇයි තොප ටා

40. ලී ප ගිනි මොලවන තෙක් දිය සැළියේ
සැප යක් යයි කකුළුව දිය කෙළියේ
එ ප වත් තොප සිතතොත් නොහැකිළියේ
සැප යක් නම් නැත කම්රස කෙළියේ

41. උඩු සුළ ගට අල්වා ගෙන යන්නේ
තණ සළු නොදැමී නම් අත දන්නේ
ව ර ප ල යයි කම්රස තෙප ලන්නේ
එද කළ කම් නිරයේ පැස වන්නේ

42. පිරුලෙන් අරගත් අබරණ මගුලට
ද ම මි න් ගැති වන අයමෙන් අනුනට
පෙර පින් ඇති තෙක් විදිනා සැපතට
තෙපි දැන් උඩඟුව නොවදිව් නිරයට

43. වද යට බැඳගෙන ගෙන යන සොරුටා
වද මල් දම්ලූ බෙර පිරිවර ටා
ලද ඉසුරෙහි ලොබ වූවොත් පිනටා
එද සැපතෙහි කළ කම් මරු රවටා

44. දැමුවෙන් ගිරි මුදුනෙන් හෙන සොරුටා
පවනින් කම් නැති මෙන් ඇඟ ගිමටා
ජරයෙන් මිදෙමින් යන මරු මුවටා
සැපතින් කිම පව් කම් කළ තොපටා

45. අල වන මේ කම් රස දොස විමසා
පල යව් තපසට පුළුවන් වය සා
පල රස විඳ ගස උඩ උන් මිනිසා
මුල සිදිනා තෙක් ඉදිදෝ නොබැසා

46. බණ නම් නිබොරුය මුනිවරයින්නේ
කය නම් නොතිරය අදහා ගන්නේ
පණ නම් තණ අග පිණි බිඳු වැන්නේ
පණී නම් නොපමාවම කර ගන්නේ

47. අසන් මෙමා කී දේ වැඩ ඇති වන
පසන් සිතින් උන්නත් පව් කර මින
උපන් නොතින් මතු යක් බූ පිසසුන
සයින් ඇවිද පිණකුත් බැරි එපවින

48. ලොබේ සිතින් පව් කළ හැම සත ටා
ස බේ කියති ගෙන ගොස් යම රජු ටා
ඉ බේ ඉන්ට නොයෙදී සිතු රඟටා
ල ෑ බේ නිරාදුක් පැමිණී එව් ටා

49. තොසින් නොයෙක් සැප විඳ සමහරු නිති
අ ෑ සින් ම දැක පව් පින් කළවුන් ගති
බ සි න් කිවත් අදහා පින් නොකරති
ගොසින් නිරේ වැටුණොත් දුක් නිම් නැති

50. පින් පව් නොදැනම අනුවණ කම් කොට
කන් නන් මස් රස සොඳමැයි කර තුට
ඉන් ගැලවෙනු බැරි නොගොසින් නිරයට
දැන් එම ආලය අරිනේ අද සිට

51. කාලා රසමුසු බෝජන කර පෙම්
ගාලා සුවඳැති සඳුනුත් මන රම්
ලාලා අබරණ නිසි ලෙස සැරසුම්
පාලා ගිය වැනි බහුරූ කෝලම්

52. මෙබස් තම නුවණින්ම විමසා නොතිර වූ කය ගති අසන්නේ
දෙතිස් කුණුවෙන් යුතුව මදකුත් සාරනු බව නැණින් දන්නේ
මිනිස් බවලත් තැනේ කුසලක් නොකර උන්නොත් අපල වන්නේ
සතිස් එක්සිය නිරේ වැටුනොත් එදයි අනුවණ කම් දැනෙන්නේ

53. පෙරත් ජාතියෙ පතා ගත් දැන් හේතු බලයෙන් මෙතැන්නේ
ළඟත් වෙන් නොව සමග දවසැර උන් නුමුත් සෙනෙහසින්නේ
පණත් යන කල තනිව ගෙයි උන් අයත් වෙන් වෙති බඳින්නේ
පිණුත් කළ නිති කැටුව යෙයි ගිය තැනේ දී සැප විඳින්නේ

54. සාර නූ කුණු කයක් ඇරගෙන කරන බහුනාටක තදේ
නැර තම හිමි සමග දවසැර උන් නමුත් සැප විඳ විදේ
ගෝර මරුවා පැමිණී කල්දැන යන්ට කැඳවා එම සඳේ
බාර වම සිටුවන්ට බැරිවෙද පිණක් කර ගත්තොත් සොදේ

55. සරණ මුනිඳුගෙ අදහ පිණකුත් නොකර ඉන්නේ කුමට දෝ
මරණ පැමිණෙන කලට යමයා අවුත් කැඳවායන්ට දෝ
කරන සොඳකම් දන් පිණක් කළ කියනු නුවණින් සොඳ වෙදෝ
කුමන අනුවණ කම් ද නෑයිනි අඬනු සිටුවා ගන්ට දෝ

56. අඬාලා කම්පාව උන්නත් ඉතින් දැක්මක් නොවන්නේ
තනාලා සිත පිණක් නොකරම කිම්ද උපයා තබන්නේ
දමාලා යන නරක කුණු කය කුමට දෝ සැප විඳින්නේ
දිනාලා මොක් පුරට යන්නට මකී මේබණ අසන්නේ

57. සි ටින ඇවිණ ගෙන මෙසසර බිළියේ
වි ඳි න මෙසැප ජරයෙන් තැළි තැළියේ
ද කි න නැටුම් වැනි විදුලිය එළියේ
මෙදැන නොකර කුසලට කම් මැළියේ

58. දන් පින් බැරි දේකැයි නො සිතන්නේ
අන් කළ පින් අනුමෝදන් වන්නේ
උන් ලද පින් සරි පින් ලැබ ගන්නේ
ඉන් වද සගමොක් සැප සාදන්නේ

59. සයට වේ ද රස මුසු බත් කන්නේ
ග ඳ ට වේ ද ඇඟ සුවඳ කර න්නේ
ලෙඩට බේති මේ මෙලොව සතුන්නේ
කුමට මීට සැපයෙකැයි සිතන්නේ

60. මානෙන් ඉඳිතත් මේ සැප පෙරුමය
සීනෙන් ගෑ සුවඳක් සේ බොරුමය
දානෙන් සීලෙන් නොකළොත් දරුමය
පානෙන් අඳුරට ගෙන යයි කරුමය

61. දර රැස ගිනි ඇවුළුණු කල නිබඳේ
ගිනි මිස දර යයි යන බස නොයෙදේ
එම ලෙස එක් කොට වදහළ මුනිඳේ
දුක මිස කයකැයි යන බස නොයෙදේ

62. ඉඳිතොත් බෝ කල් ජරයෙන් විසිරේ
නැතහොත් වැදයයි මරුමුව කුහරේ
මෙමහත් ජරමර දෙදෙනා අතරේ
මෙසැපත් සැපයයි ගනිදෝ කවරේ

63. අසල් ගෙයෙක සොරකම් ගිය දවසෙක
කුහුල් සිතින් ඉඳිනේ තම ගෙය රැක
සයි ල් සතුන් මරු ගෙන යනවා දැක
කුසල් නොකර ඉඳිනේ ඇයි නොව සැක

64. ගඟ යන ඇත් කුණ ඉඳ මස් රසටා
සිඳු මැද වැද වැනසුණු මෙන් කපුටා
ලද ඉසුරෙහි ලොබ කළහොත් තොපටා
බව සයුරෙන් ගමනෙක් නැත ගොඩටා

65. ප ර සතුරන් එති එති යන බසටා
හැ ර අඹුදරුවන් යන තොප වලටා
ගොර ජර මරු එනු දැක දැක වෙතටා
ප ර මාදව ඉඳිනේ ඇයි පිණටා

66. ගඟ වතුරෙහි යන මිනිසකු දුකිනේ
ළඟ කළ ඔරුවට නොනැගෙන ලෙසිනේ
සගමොක් දෙන බණ අදහා නොගෙනේ
දුගතිය වැද තොප කිම දුක් විඳිනේ

67. සලි ප් නැටුම් සේවා කම් පෑ තද
අල්ප දෙයක් උදෙසා විඳිනා වද
සලි ප් හදා රැක්කෝතින් තතු ලෙද
කල්ප දහස් සුරසිරි විඳිනේ වද

68. උන් න ත් නැඟි සිටිනට බැරි තීරුව
සි ටි ය ත් ඉඳිනට බල නැති මාරුව
ජ ර ප ත් වූ කල නොතිබෙයි මේ රුව
කරතොත් කරගන් දන් පින් සීරුව

69. මුන් හැම අඹුදරුවන් උපදින්නේ
පින් බලයෙන් බෝ කල් පවතින්නේ
උන් කළ පින්මය උන් රඳවන්නේ
ඉන් සිත ලොබමය තොප පවතින්නේ

70. සලී ගුණේ පිහිටා ගෙන නොයිඳේ
ආල ය කර රකිනා තොප නිබඳේ
බාල පියඹුදරුවෝ නම් මෙසඳේ
බාල කලට කෙළිනා උතු වළඳේ

71. දු ක් ගෙන රැස් කර දන හැම කැමතී
නි ක් මෙන නිරයට නරයින් සිරිතී
දු ක් දෙන අඹුදරුවන් නිති රකිතී
මොක් දෙන පිරිසිදු සිල් නොම රකිතී

72. නොලදත් අහරක් සාදුක් දුරු කොට
නැතුව ත් කඩ රෙද්දක් එක පටකට
බලවත් නිරයේ තද දුක් සිහි කොට
ම ඳ කු ත් පසු නොබසිව් තෙපි පිණකට

73. නසය තාත් සිත ලොබ අනුවණ දොසමය
වසතොත් සැදැහැත්තන් ඇති දෙසමය
දෙසතොත් සගමොක් දෙන උපදෙසමය
අසතොත් මුනිඳුන් වදහළ බස මය

74. වැනුවා නම් බුදු ගුණ වැනුවා මය
තැනුවා නම් තම සිත තැනුවා මය
දෙනුවා නම් දන් පින් දෙනුවා මය
දිනු වා නම් පරලොව දිනුවා මය

75. අසතොත් නිබොරුව මුනිඳු තෙපුල්මය
හරිතොත් නොතබා දස අකුසල්මය
රකිතොත් සිත පිරිසිදු කොට සිල්මය
දනිතොත් මෙසියල්ලට මේ කල්මය

76. මෙ ස සර දුක් රැක විස පලගත් අතු
ලෙ ස සිටියා මෙන් සිය පලයෙන් යුතු
තොස වඩමින් ඉන් බැහැර නොලා සිතු
ද ස අකුසල් පල අසව මෙයින් මතු

77. බුදු බණ අසමින් සිත සත පායේ
කුරු පණ කම් හැර පිය ඒ පායේ
පර පණ නැසුවොත් කවර උපායේ
අ ප මණ දුක් දෙයි සතර අපායේ

78. මැඩියන් නයි මුව ගොදුරුව ඉඳ යා
පණුවන් කන මෙන් රස විඳ විඳ යා
සැලෙමින් ජරගොර මරු මුව වැද යා
බ ල මු න් පරපණ වනසන ලෙද යා

79. බලයෙන් වත් කිසියම් සොර සිතකින්
සයි තින් වත් දැන්වූ උපදෙස කින්
පරසන් තක දෙය ගත සොරකමකින්
නිරයෙන් නිරයට පැමිණෙයි එතෙකින්

80. ලොබිනා මිහිරිව සොරකම් කළ සත
වි ඳි නා දුක් මේ ලොව මෙතෙකැයි නැත
මෙදිනා ඒ දැක දැක ඉන් නොනැව ත
ඉ ඳි නා කල කිකලක වේ දෝ සෙත

81. අසු කොට ගත නොතබති ආදාරය
වද කොට මැරුවත් නැත එ විචාරය
ලගු කොට නොසිතව් පව් පරදා රය
නි ර ය ට ඇදගෙන යන එම පාරය

82. අසවා මකියන බස් අර තරයේ
මුසවා බස් කීවා එක මුරයේ
වසවා දෙව්ලොව යන මං තරයේ
පැසවා මිස නාරී ගොර නිරයේ

83. පල දෙන පව් පින් දෙක නොබලාමේ
ප ව ස න බස් උරසක් මාලාමේ
බි ඳ ව න බස් වැඩ නැති කේලාමේ
මතු වන දුක් නොදැනෙන වේලාමේ

84. අ ැවිස නොකිය බස් කනට යවුල් ලෙස
සිත ස තොසින් කිය කියතොත් පිය බස
පරුැස තෙපුල් බිණුවා නම් මහ දොස
එ වි ස නොයයි පරලොව දුක් දී මිස

85. පෙර සිට වියතුන් නොකියා වැළකී
දෙලොවට වැඩ නැති බස් අකුසලෙකී
කෙළියට වත් ඒ වැඩ නැති බසෙකී
නි ර ය ට වැද යන රජ මාවතෙ කී

86. අන්සතු සැපතක් දැක දළ ලොබිනේ
උන්ට නොවී මට වේවයි සිතිනේ
මන් කළ ඒ සිත අටගත් පවිනේ
උන් මතු නිරයේ දුක්මයි විඳිනේ

87. රිසි නු දනහට කර වා දේයා
නසි වයි යන සිත වැපා දේයා
බසි නා නිරයට ඒ පා දේයා
කිසි කලෙකත් ඒ ඒපා දේයා

88. නි ව න ට මග මේ යයි මුනි කී යම්
ද හ ම ට වෙන් වූ දෙසැටක් සමයම්
සරි කොට ගත් සිත වෙයි මිසදිටු යම්
ස ස ර ට බිජුවටමයි ඒ සම යම්

89. නට සිල් මිසදිටු ගත් අය කැමතී
අට ගත් කප් ගිනි කඳ මැද පැසෙතී
අට මහ නරකය පැසුනත් නොමැතී
පිට සක්වළ එක් පෙදෙසක පැසෙතී

90. නොයෙකී රස බිම නිඹ බිජුවට ලත
එ මැ කී සිටිනෙය තිත්තව පලගත
මෙම කී මිසදිටු අදහස් ඇති සත
ක ළ කී දෙය අකුසල් මිස පින් නැත

91. මේ දස අකුසලි නෙකකුත් කළහොත්
උපදෙස කින් බසකින් කරවූ වොත්
එ වි ග ස එක් අදහස සිත සිතුවොත්
නොවලස මොහු හැම දෙන නිරයට යෙත්

92. කරදර දස අකුසලයෙන් නොමිදී
වැරසැර පැවොත් මෙමිනිස් ලොවදී
මෙරගිරි මුදුනෙන් හුණු මෙන් නොරැඳී
පරතෙර නැති දුක් සයුරේ කිමිදී

93. බුදුවත් මෙතෙකැයි නොකියැකි පිරිසිඳ
බලවත් මහදුක් විඳුවන හැම සඳ
සිතුවත් බිය වන අටමහ නරකද
ඔසුපත් සහ එක්සිය සතිසෙක් වද

94. තෙ ස් ය ක් තෙප් මුව වැද සිදුරුැව ගත
ද ව ස ක් මිනිසකු විඳි දුක් නොනැවත
මොහොතක් නිරයේ විඳි දුක් සමවත
අ බ ැට ක් හා සරි නොවෙදෝ හිමවත

95. පෙර අඟ නක් එක් එළු දෙනක ඉසසිඳා
සිය ල ඟ වැළඳි ගිනිදැල් නිරය දුක් විඳා
ඇය ඇඟ ලෝම ගණනේ ඉස් කැපුම් ලදා
මෙමරඟ වේය කාටත් අකුසලේ ලෙදා

96. කෙළි යට කඩක් සඟවා යහළුවකු ගෙනේ
හෙළි කොට නැවත දුන් මිනිසකුට එතෙකිනේ
වි ළි වැස්මක් නොලැබිණි දෙව් වුනත් අනේ
කෙළි යට වත් නොකරව් සොරකමක් දැනේ

97. නොනැවති අයෙක් පෙර පරදර පව් කැමති
ගු ගු ර ති ගැලෙති තිස්වා දහසින් උඩෙති
හිමි නැති තවම ලෝකුඹු නිරයේ පැසෙති
නොකරති මෙපව් නුවණැති අය වැඩ කැමති

98. ලැ දි ව රජෙක් බොරුැ බස් කී විගස කයා
නැ ති ව රිද්දි බලයත් ඒ මිනිස් කයා
පොළොව පළාගෙන ගොස් වැටුණී නර කයා
මෙලොව සතුනි ඉන් බොරුැ කීම නරකයා

99. පිසුනු කියා සඟ දෙනමක් වෙනස් කොට
පැසුනු එකෙක් නිරයේ කල්පයක් සිට
මුහුණු කුණුව තව පේතව විඳ ගැහැට
පිසුණු බසක් නොකියව් අද පටන් කොට

100. පෙ ර මහණෙක් සඟ ගණහට බැණ නපුරු
නි ර යේ වැටී බිම සත් ගව් වැඩෙන තුරු
ගොර දුක් විඳි තව පේතව සිට කුරිරු
ප ර හට එයින් නොකියව් බස් නොපියකරු

101. කිවොත් වැඩක් නැති බස් ගොර නිරා ගැබේ
ම හ ත් කුරිරු දුක් විඳ යළි අවොත් මොබේ
කි ව ත් සැබෑ නොගනිති ඔහුගෙ බස් සබේ
ගෙවත් සසර දුක් මෙම නොකියතොත් සැබේ

102. අන් සතු දෙයක් වේවයි සිතුව තමහට
ඉන් දුගතියෙහි දුක් විඳ අව මේ ලොවට
උන් සිතුවා සිදු නොමවෙයි සිතූ ලෙසට
මින් මතු සිතක් නොසිතව් එවැනි පවකට

103. බෝවා ද හස් පැසවන නිරය වෙන වෙන
ව ෘ ප ා ද නම් රුදු මන බව නපුරු වන
අ ා බ ා ද දුක් විඳුවන උපනුපන් තැන
ව ෘ ප ා ද යක් නොසිතව් දැන දැන සිතින

104. ක ල ක් නිරා දුක් විඳ විටෙක ගොඩ දුටු
නොයෙක් රෝග අටගෙන ගත වෙයි අරිටු
උ ද ක් නුවණ නැතිවේ සිත වෙයි කිලුටු
ෙ ම ව ක් පටන් විස මෙන් සිතව මිසදිටු

105. බවයෙන් බවයෙහි කෙළෙසුන් නොයෙකී
තොපදැන් විඳිනා දුක් දැන නිසැකී
ස ස රි න් ගොඩ නැගුමට මුනිඳුන් කී
ලෙසපින් පවසම් ඇසුවොත් යෙහෙකී

106. අන් හට අලසව නොකොට විදානය
පින් මිස අනිකක් නොකොට පදානය
තුන් සිත පිරිසිදු කොට දුන් දානය
උන් ගිය ගිය තැන ලැබෙයි නිදානය

107. ඇතුළට වැදගෙය ඇවිලෙන ගින්නේ
පිටතට හළ බඩුමය වැඩ වන්නේ
මෙසිතට ගෙන ලොබ නොව දන් දෙන්නේ
තමහට එමවද මතු පල දෙන්නේ

108. බුදි න ට ගත් බත් පි☸ මිස වෙන නැත
ය දි හ ට දන්දෙව මතු දුක් නොවිඳිත
මෙම හට ඇත ඉතිරිය දෙමි යන සිත
හැමරට රජසිරි සැප ලදුවත් නැත

109. පින් නොකරන දුදනන් බස් නාදා
තුන් දොස් මල දුරුකර සිත පාදා
පන් සිල් නිති අටසිල් රැක පෝදා
ඉන් මොක්පුර පැමිණෙව් නොව බාදා

110. ලොල් සිත මුල් සිඳ නිති තැත් සිතිනේ
සි ල් පිරිසිදු කොට සඳරැස් ලෙසිනේ
ව ල් රකිනා සෙමරකු මෙන් රකිනේ
ක ල් නොයවා ඉන් මොක් සිරි ලබනේ

111. වෙත්වා සව් සත සැමකල් නිදුකී
පත්වා සැපතට රෝ දුක් වැළකී
යෙත්වා සමගිව නිවනට මුනි කී
මෙත්බා වන නම් වැඩි පින් කමෙකී

112. ය හ ප ත නොසිතන සැටි මේ දනයා
කි පි ස ත උනුනට දෙති වේ දනයා
හැම ස ත වෙත කළ මෙත් බා වනයා
සැක නැත සගමොක් සැප සාද නයා

113. දෙන්නන් දැන දුන් රන් සේ පොළියට
දුන් දුන් සේ තම කළ පින් අනුනට
එන්නෙන් දියුණුව තියුණුව තම හට
ඉන් දැන් නුකුසී වවු පින් දීමට

114. මුනිඳුන් කී බණ කරමින් පුහුණු
දෙසමින් දනහට වඩමින් කුලුණු
එපිනෙන් නොපැමිණ නිරයට දරුණු
ලැබගන් මතු සගමොක් සිරි දියුණු

115. දිව ම න් මුනිඳුන් දුටු මෙන් තොසවා
බණ දන් නන් හට වැඳ අත් ඔසවා
පදයෙන් පදයට අදරින් අසවා
එපිණෙන් නිරයට යන මං වසවා

116. දුරු කොට හැම විට සිත ඇති මානේ
ගරු කොට වැඳ වැඳ දුටු තෙක් මානේ
මු නි ඳු ට පුද කළ බත් මල් පානේ
ස ත හ ට සගමොක් මග එම පානේ

117. ඇ ත ලොව වන පස මල් හැම දවසා
කොත නක පිදුවත් මුනිඳුන් උදෙසා
සි ත මෙවිතර පිනටත් නොම සලසා
ස ත සසරින් ගැලවෙන්නේ කෙලෙසා

118. මුනි පුත් සඟ ගණ මව්පිය ගුරුවර
ජ ර පත් කුල දෙටු ගිලනුන් තවසර
රැක සිත් සේ කළ අත්පා මෙහෙවර
සු වපත් කර සිරි විඳුවයි සුරපුර

119. ලොව ඇත්තන් නුවණින් විමසා දැක
හිත නැත්තන් යයි නොසිතා වෙනසක
ගුණ ඇත්තන් ගුණ කීම නොවී සැක
නුවණැත්තන් පින් කරන උපායෙක

120. ගොඩ ලම්නේ සත්වග බව දුකිනේ
ගෙන නිවනේ සිටුවන තුටු මතිනේ
තුණුරුවනේ ගුණ සිහි කළ සිතිනේ
නැත විඳි නේ දුක් සසරෙහි ඉතිනේ

121. පින් මිස නෑයන් වන පිහිටෙක් නැත
උන් දෙන මතු හිමි වන දෙයකුත් නැත
ඉන් මතු අදහා සිහි කරතොත් සත
අන් කුසලක් නොකළත් මෙම දේ ඇත

122. පුරවා සත් රුවනින් මුළු දෙරණය
කරවා පායක් බඹලොව පමණය
බඳවා රන්දද ලා මිණි තොරණය
දෙනවා ටත් වැඩි පින් බුත්සරණය

123. අපමණ සැප සපයා දෙන සත හට
කුරුපණ අවබිය පැවතුම් නැති කොට
බුදු බණ ලෙස පැවතුම් බැරි මෙතොපට
තිසරණ මිස පිහිටක් නැත සසරට

124. අ ස මි න් මෙ දහම් අලසව නොඉඳේ
පු ර මි න් මෙ සියලු පින්කම් නිබඳේ
කෙලෙසුන් මුල් නොතබා සිත පසිඳේ
ල ැබගන් සගමොක් මතු දුක් නොවිඳේ

125. සිඟපත් එකෙක් පෙර අනුරුදු තෙරුන් දැක
තමලත් බතින් දුන්නේ එකම සැන්දක
බලවත් එයින් සුරපති වීය ඉන් දක
නැණවත් කරව් දන් පින් පල මෙයින් දැක

126. දවසක් විතර සිල් රැකි කුළඟනක් පෙරා
දහසක් සුරඹ පිරිවරමින් රුවින් සරා
තවසක් දෙව්ඳු ලග සිරි විඳ නිරන්තරා
විගසක් එසිල් තොර නොකරව් සිතින් දරා

127. පින් මිස නෑයන් වන පිහිටෙක් නැත
උන් දෙන මතු හිමි වන දෙයකුත් නැත
ඉන් මතු අදහා සිහි කරතොත් සත
අන් කුසලක් නොකළත් මෙම දේ ඇත

128. පුරවා සත් රුවනින් මුළු දෙරණය
කරවා පායක් බඹලොව පමණය
බඳවා රන්දද ලා මිණි තොරණය
දෙනවා ටත් වැඩි පින් බුත්සරණය

129. අපමණ සැප සපයා දෙන සත හට
කුරුපණ අවබිය පැවතුම් නැති කොට
බුදු බණ ලෙස පැවතුම් බැරි මෙතොපට
තිසරණ මිස පිහිටක් නැත සසරට

130. අ ස මි න් මෙ දහම් අලසව නොඉඳේ
පු ර මි න් මෙ සියලු පින්කම් නිබඳේ
කෙලෙසුන් මුල් නොතබා සිත පසිඳේ
ල ැබගන් සගමොක් මතු දුක් නොවිඳේ

131. සිඟපත් එකෙක් පෙර අනුරුදු තෙරුන් දැක
තමලත් බතින් දුන්නේ එකම සැන්දක
බලවත් එයින් සුරපති වීය ඉන් දක
නැණවත් කරව් දන් පින් පල මෙයින් දැක

132. දවසක් විතර සිල් රැකි කුළඟනක් පෙරා
දහසක් සුරඹ පිරිවරමින් රුවින් සරා
තවසක් දෙව්ඳු ලග සිරි විඳ නිරන්තරා
විගසක් එසිල් තොර නොකරව් සිතින් දරා

133. මින් ලබමී නොසිතා කිසි උපකරණ
මුන් සසරින් ගොඩලම් යන සිත කුලුණ
පින් පව් දෙකම නොවරදවා කිවොත් බණ
ඉන් තොප විඳින සැප මෙතකැයි නැත පමණ

134. කළ හොත් සිල්වතුන් හට නිති වතාවත
දුටු සත් කෙනෙක් වෙති ඕහට ඉතා හිත
නැණ ඇත් තවුන් සාදන පින් වතාවත
ඉ ම හ ත් පිනෙකි දැන ගනිතොත් හිතාහිත

135. පින් කම් කරන අය ඒ දියුණු වන ලෙස
මන් සන් තොසින් එහි ගුණ කියත ඇති ලෙස
උන් උපනුපන් තැන පැතිරෙයි ලොව යසස
පුන් සඳ පහන් වුමෙනි අදහව මෙබස

136. තිස ර ණ ගත් එක් මිනිසෙක් එක් කලෙක
නොපැමිණ දුගතියට සිට කප් එක් තිසෙක
අ ප ම ණ සැපත් සගමොක් සැප ලදි නිසැක
එ ස ර ණ නොගෙන තොප විඳිනේ කිම මෙ දුක

137. අනුවණ කමින් සිහි නොකරනු මිස සතත
අසරණ තොපට පිළිසරණක්මය නියත
බුදුගුණ සිතින් එකඟව සිහි කරත හොත
අපමණ සැපත් සිදුවෙයි සැක නොකර සිත

138. ලොවට උතුම් මුනිරජුගේ ගුණ විපුල
සි ත ට රැගෙන සිහි කළ නුවණින් නිමල
ස ත ට නොවී කලෙකත් බව දුක් අසල
ය ස ට එයින් සිදු වේ සුබ සිරි මඟුල

139. නොද න ලෙවන් හට පව්පින් නියම කොට
බ ඳ ලෝවැඩ සඟරා පිනෙනි හැම විට
ල ද සැපතින් තොර නොව ලැබ නිති පිහිට
වැ ද සව්සත සැනසෙත්වා මොක් පුරට

140. වී දා ගම වෙහෙරෙහි මෙත් තෙරිඳු සඳ
සාදා රණව පැවසූ මෙත් සිතින් නඳ
බාදා නොවී මොක් දැකුමට බැඳි මෙ පද
පාදා සතන් සිත පවතීවා නිබඳ

සිරිලක ඔන්ලයින් අධ්‍යාපන තක්සලාව

www.eduLanka.LK